# පලතුරු වගාවේ සාර්ථක අස්වැන්නක් සඳහා ක්‍රමාණුකූල ශාක පෝෂක කළමනාකරනයේ වැදගත්කම

බෝඹුවල, ප්‍රාදේශිය කෘෂිකර්ම පර්යේෂණ හා සංවර්ධන ආයතනයේ
**පර්යේෂණ නිලධාරී ආචාර්ය ජේ.ඩී.එච්. විජේවර්ධන**

අප රටෙහි වගාකරනු ලබන පලතුරු වර්ග බොහෝය. මින් බොහොමයක් ලංකාවේ බොහෝ ප්‍රදේශවල වගා කරනු ලබන අතර සමහරක් ඒ ඒ දේශගුණික කලාප වලට ආවේනික වී ඇත. බොහෝ පලතුරු වර්ග ප්‍රධාන වශයෙන් ගෙවතු වගාවන් ලෙස පවත්වා ගෙන යනු ලබන අතර සමහරක් සාර්ථක වානිජ වගාවන් ලෙස ද පවත්වා ගෙන යනු ලැබේ. මින් පෙනී යන්නේ වානිජ වගාවන් මෙන්ම ගෙවතු වගාවන් ද ක්‍රමානුකූලව නඩත්තු කිරීම අප රටෙහි පලතුරු අවශ්‍යතාවයන් සපුරා ගැනීමට සෘජුවම බලපාන බවයි.

## විශේෂ ලක්ෂණ

බොහෝ පලතුරු බෝග, වාර්ෂික බෝග මෙන් නොව දීර්ඝකාලීන වර්ධක කාලයක් ඇත. එසේම බොහොමයක් පලතුරු බෝග විශාල ගස් ලෙස වර්ධනය වන අතර විශාල වර්ධක කොටස් ද දක්නට ලැබේ. නමුත් වර්ධක කොටස් ප්‍රමාණය හා සසඳන කළ බොහෝ පලතුරු ගස් ලබාදෙන අස්වැන්න එයට සාපේක්ෂව අඩු ප්‍රමාණයක් බවද සැලකිය හැකිය. පලතුරු බෝග වල දක්නට ලැබෙන විශේෂ ලක්ෂණ නම් දේශගුණයට, පසේ පෝෂක තත්ත්වයට හා පසේ ගැඹුර වැනි සාධක සඳහා සංවේදී වීමය. එසේම වෙනත් බෝග හා සසඳන කල පලතුරු බෝග සැලකිය යුතු ශාක පෝෂක ප්‍රමාණයක් උරා ගනී. මේ නිසා සාර්ථක අස්වැන්නක් ලබා ගැනීමට සැලකිය යුතු ශාක පෝෂක ප්‍රමාණයක් පසේ අන්තර්ගත විය යුතුය. නොකඩවා පලතුරු බෝග මගින් ශාක පෝෂක පසෙන් ඉවත්වන නිසා එම ශාක පෝෂක පසට නිරන්තරයෙන් ලබා නොදුනහොත් වගාවෙන් සාර්ථක අස්වැන්නක් ලබා ගැනීමට නොහැකි වනු ඇත. මේ සඳහා මූලික, ද්විතීක හා අංශු මාත්‍ර මූල ද්‍රව්‍යයන් සියල්ලම පිළිබඳව අවධානය යොමු කළ යුතුය. එසේම සමහර පලතුරු බෝග යම් යම් මූලද්‍රව්‍ය සඳහා වැඩි ඇල්මක් දක්වනු ලැබේ. මේ නිසා පලතුරු වගාවේ සාර්ථකත්වය සඳහා ක්‍රමානුකූල ශාක පෝෂක කළමණාකරනයක් තිබිය යුතු බව හොඳින් පැහැදිලි වනු ඇත.

## වර්තමාන වගා තත්ත්වය

කෙසේ නමුත් ලංකාවේ වාණිජමය ලෙස වගා කරනු ලබන සමහර පලතුරු වගාවන් හැරුණුවිට බොහෝ පලතුරු බෝගයන්හි ශාක පෝෂක කළමනාකරනය පිළිබඳව කිසියේත්ම සැහීමකට පත්විය නොහැක. විශේෂයෙන්ම ගෙවතුවල දක්නට ලැබෙන පලතුරු සඳහා බොහෝවිට කාබනික හෝ රසායනික පොහොර භාවිතයක් සිදු කරනු නොලැබේ. මෙම හේතුව නිසා එවැනි පලතුරු බෝග මගින් වගාකරුවන්ට ආර්ථික වාසියක් නැතුවා මෙන්ම එවැනි වගාවන් ක්‍රමයෙන් පරිහානියට පත්වීමද සිදුවේ. මෙවැනි හේතු නිසා රටේ සමස්ත පලතුරු නිෂ්පාදනය අඩුවන අතර තවදුරටත් පලතුරු වගාව සඳහා ගොවියා නැඹුරුවීමේ ප්‍රවනතාවය ද අඩුවී ඇත. රටේ ජනගහනය වැඩිවීමත් ජනගහනයේ පෝෂක තත්ත්වයන් උසස් කිරීමටත් හා ලාබදායී ලෙස පලතුරු වගාව පවත්වා ගැනීමටත් අද අත්‍යාවශ්‍ය බැවින් පලතුරු වගාවන් පුනරුත්ථාපනය කිරීමට සුදුසු කාලය එළඹ ඇත. මෙම හේතු නිසා පසුගිය වර්ෂ කීපය දෙස හැරී බැලීමෙන් පෙනී යන්නේ අප රටෙහි බොහෝ පලතුරු වර්ගවල අස්වැන්න සැලකිය යුතු ලෙස පහත බැස ඇති බවයි.

## විශ්ලේෂණ වාර්තා

ලංකාවේ නොයෙක් ප්‍රදේශවල පලතුරු වගා බිම් වලින් ලබා ගන්නා ලද පස් නියැදි විශ්ලේෂණ වාර්තා අධ්‍යයනය කිරීම මගින් පෙනී යන්නේ බොහෝ පලතුරු වගා කරනු ලබන භූමි වල සැලකිය යුතු ලෙස ශාක පෝෂක අඩු බවයි. එවැනි පසෙහි මූලික පෝෂ්‍ය පදාර්ථ පමණක් නොව ද්විතීයික හා අංශු මාත්‍ර මූලද්‍රව්‍යයන් පවා ඌන තත්ත්වයේ පවතිනු ඇත. මීට අමතරව බොහෝ පලතුරු වගා කරනු ලබන පස්හි දක්නට ලැබෙන්නේ ඉතාමත් අඩු කාබනික ද්‍රව්‍ය ප්‍රමාණයකි. එසේම විශේෂයෙන් තෙත් හා අන්තර්මාධ්‍ය කලාපවල දක්නට ලැබෙන පස් අධික ආම්ලික බවකින් ද යුක්තය. ඉහත කරුණු සලකා බැලීමේදී බොහෝ පලතුරු වගාකරනු ලබන පසෙන් සාර්ථක අස්වැන්නක් ලබාගත නොහැකි තත්ත්වයේ පවතින බව හැගේ.



## පිළියම්

මෙම තත්ත්වයන් මගහරවා ගැනීමට ඒ ඒ පලතුරු බෝග සඳහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුව නිර්දේශ කර ඇති රසායනික පොහොර වර්ග හා ප්‍රමාණයන් යෙ°ම කළයුතුය. එසේම තෙත් කලාපයේ හා අන්තර් මාධ්‍ය කලාපයේ වගා කරනු ලබන පලතුරු වගාවන් සඳහා වර්ෂයක් පාසා ඩොලමයිට් කි.ග්‍රෑම් 2 ක් ගසකට යෙ°ම සි≥කරන්න. ඩොලමයිට් යෙ°ම රසායනික පොහොර යෙ°මට සති 2-3 කට පෙර සි≥කිරීම වැදගත්ය. ඩොලමයිට් යෙ°මෙන් රසායනික පොහොර වලට සි≥විය හැකි අහිසි බලපෑම් මගහැරේ. මීට අමතරව ඒ ඒ ප්‍රදේශ වල පහසුවෙන් සොයා ගත හැකි කාබනික පොහොර වර්ග යෙ°මද සාර්ථක පලතුරු අස්වැන්නක් ලබා ගැනීමට හේතුවේ. මේ සඳහා බොහෝ ප්‍රදේශවල දක්නට ලැබෙන පිදුරු, වතුවල දිරාපත් වී යන කුණු රොඩු, ගොම, කුකුල් පොහොර, කොම්පෝස්ට් වැනි දෑ පහසුවෙන් භාවිතා කළ හැකිය. කෙසේ නමුත් කාබනික පොහොර ද රසායනික පොහොර මෙන් අධික ප්‍රමාණ භාවිතා කිරීම හානිදායකය. එබැවින් හොඳින් වැඩුනු පලතුරු ගසක් සඳහා වියළි කාබනික පොහොර කිලෝග්‍රෑම් 5-10 ක් හෝ කූඩා 1-2 ක් පමණ යොදන්න. විශේෂයෙන් කුකුල් පොහොර යෙ°මේ° අධික පොහොර ප්‍රමාණයක් යෙ°ම පලතුරු ගස් වලට හානිදායක විය හැකිය. එසේම කාබනික හා රසායනික පොහොර යෙ°ම ගසේ සිට අඩි 1.5 සිට 2 ක් පමණ ≥රින් අතු විහි° යන ප්‍රදේශය තුළ සි≥ කරන්න. කාබනික හා රසායනික පොහොර දෙවර්ගයම යෙ°මෙන් පසු එම පොහොර හොඳින් පසට මුල්ලු කරන්න. වාර්ෂික වගාවන් සඳහා පොහොර යෙ°ම වර්ෂාව ආරම්භ වීමත් සමග සි≥ කරන්න. නමුත් ගෙවතු වගාවන් සඳහා ජලය සැපයීමට හැකි නම් පොහොර යොදා ක්‍රමානුකූලව ජල සම්පාදනය සි≥ කරන්න. වියළි කාලගුණයක් ඇති අවස්ථාවල° විශේෂයෙන් වසුනක් භාවිතා කිරීම පලතුරු බෝග මගින් සාර්ථක අස්වැන්නක් ලබා ගැනීමට හේතුවේ. වසුනක් යෙ°මේ° ද ගසේ සිට අඩි 1.5 - 2 ක් ≥රින් ආරම්භ කර ගසේ අතු විහි° යන ප්‍රදේශය තුළ සි≥ කරන්න. වසුන් යෙ°මේ° වේයන් බෝවීම සඳහා ප්‍රවනතාවයක් ඇති ද්‍රව්‍ය යොදා නොගැනීමටද වග බලාගන්න.

කූඩා පලතුරු සඳහා පොහොර යෙ°මේ° ගසේ සිට අඩි 1/2 - 1 ක් ≥රින් පොහොර යොදන්න. මෙය පැලයේ ප්‍රමාණය අනුව සු≥සු ලෙස වෙනස් කර ගත හැකිය. කූඩා පැලයකට පොහොර යෙ°මේ°ද වැඩුනු ගසකට මෙන්ම ගසේ අතු විහි° යන ප්‍රදේශය මුල්ලු කර පොහොර යෙ°ම කළ යුතුය.

පලතුරු පොහොර මිශ්‍රණයන්හි පොස්පේට් පොහොර අන්තර්ගත බැවින් පොහොර යෙදූ සෑම අවස්ථාවකම පස මුල්ලු කර යෙදූ පොහොර මුල් දක්වා කාවැද්°මට සැලැස්විය යුතුය. එමගින් යොදනු ලබන පොහොර මගින් උපරිම ප්‍රතිඵල ලබා ගැනීමට හැකි වේ.

බොහෝ විට පලතුරු බෝග වල නොයෙක් ද්විතික හා අංශු මාත්‍ර මූලද්‍රව්‍ය ඌනතා ලක්ෂණ ද දක්නට ලැබේ. එවැනි අවස්ථා වල° එවා හ∫ නා ගෙන ඒ සඳහා සු≥සු රසායනික ද්‍රව්‍ය හෝ පොහොර වර්ග නිර්දේශ අනුව පත්‍ර මතට ඉසීම හෝ පසට යෙ°ම සි≥කළ යුතුය. එසේ නැතහොත් මූලික පෝෂ්‍ය පදාර්ථ නිසි ලෙස සැපයුවද ද්විතියක හා අංශු මාත්‍ර මූලද්‍රව්‍ය ඌණතාවයන් නිසා පලතුරු බෝග වල අස්වැන්න සැලකිය යුතු ලෙස අඩුවනු ඇත. පලතුරු වගා ආශ්‍රිතව බොහෝ විට අංශු මාත්‍ර මූලද්‍රව්‍ය ඌණතා දක්නට ලැබීම සුලබය. ඌණතා ලක්ෂණ හ∫ නා ගැනීම සඳහා ප්‍රදේශයේ කෘෂිකර්ම උපදේශක මහතාගේ හෝ මහත්මියගේ උපදෙස් ලබා ගත හැකිය. එසේ නැතහොත් ළඟම ඇති කෘෂිකර්ම පර්යේෂණ ආයතනයකින් ද මේ සඳහා සහාය ලබාගත හැකිය. ඔවුන් මාර්ගයෙන් ඌණතා ලක්ෂණ මග හරවා ගැනීමට අවශ්‍ය පොහොර වර්ග, එවා යොදන ආකාරය හා යෙදිය යුතු අවස්ථා පිළිබඳව විස්තර ලබාගත හැකිය. දියර පොහොර ලෙස ශාක පෝෂක පත්‍ර මතට යෙ°මේ° දහවල් කාලයේ අධික උෂ්ණත්වයක් ඇති අවස්ථාවක නොයෙ°මට වග බලා ගන්න. උදය කාලයේ හා සවස් කාලයේ අව්ව අඩු අවස්ථාවක දියර පොහොර යෙ°ම වඩාත් ප්‍රතිඵල දායකය. එසේම දියර පොහොර මගින් තද වියළි කාලගුණයක් පවතින අවස්ථාවල° එතරම් ප්‍රයෝජනයක් නොලැබෙන අතර වර්ෂාව පවතින කාලයක° නම් වර්ෂාව නොමැති දිනයක යෙ°ම වඩාත් ප්‍රතිඵලදායකය.

පලතුරු ගසකින් සාර්ථක අස්වැන්නක් ලබා ගැනීමට ක්‍රමානුකූල පොහොර භාවිතය මෙන්ම අතු සහිත පලතුරු ගස් සු≥සු ආකාරයට කප්පා≥ කිරීම මගින් අනවශ්‍ය අතු ඉවත් කිරීම, ගස් අතර ක්‍රමානුකූල පරතරයක් පවත්වා ගැනීම, කෘමි හා රෝග පාලන ක්‍රම අනුගමනය කිරීම, පසේ සෝදා පාΩව අවම කර ගැනීම පලතුරු වගා බිංම් වල මර්දනය ආදියද අත්‍යාවශ්‍යය. කෙසෙල් වගාව ආශ්‍රිතව නම් ප∫ රු පාලනය වැනි කරුණු පිළිබඳව ද සැලකිලිමත් විය යුතුය. එසේම වියළි කාලයේ° ක්‍රමානුකූලව ජලය සැපයීමද පලතුරු බෝග මගින් සාර්ථක අස්වැන්නක් ලබා ගැනීමට හේතුවේ.

*සැලකිය යුතුයි* - මෙම පිටුවේ පරිගණක දෝශයක් නිසා පහත සඳහන් අකුරු වෙනුවට සංකේතයන් මුද්‍රණය වී ඇත. කරුණාකර එය නිවැරදිකර කියවන්න.

° = දී ≤ = දැ ≥ = දු ∞ = ධා Ω = ළු ∫ = ඳු

### ධම්ම පදයෙන්

උට්ඨානවතො සතිමතො - සුචිකම්මස්ස නිසම්ම කාරිනො

සඤ්ඤතස්ස ච ධම්මජීවිනො - අප්පමත්තස්ස යසොභි වඩ්ඪති

නැඟී සිටි වියර් ඇති, තමා ගැන තමාට ම ≤නෙන සිහිය ඇති, නිරුංග රද් කරන, විමසා බලා කටයුතු කරන තැන්පත් ≤හැමි දිවි පැවතුම් ඇති නොපමා පුද්ගලයාගේ කීර්තිය මනාව වැඩේ.